ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


| මගේ අංකය<br>எனது இல.<br>My No | ඔබේ අංකය<br>உமது இல.<br>Your No | දිනය<br>திகதி<br>Date 2024.08.11 |
|---|---|---|

පැමිණිලි පාර්ශවය : එන්.ඩබ්.ඒ.ආර්.ඩබ්. නානායක්කාර මයා,
අංක 23, ගල්වල පාර,
නුගේගොඩ.

වගඋත්තර පාර්ශවය : 01. උපකුලපති,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,
ගංගොඩවිල,
නුගේගොඩ.

02. සභාපති
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,
20, වෝඩ් පෙදෙස
කොළඹ 07

පැමිණිලි අංකය : HRC/2858/21

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් ප්‍රකාශ කර සිටින්නේ, 2020.08.30 දින "Sunday Observer" පුවත්පතේ පළ කරන ලද දැන්වීමක් මඟින් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (Iශ්‍රේණිය)/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය ) සහ කථිකාචාර්ය (ආධුනික) තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා තිබූ බවත්, එකී දැන්වීම අනුව පැමිණිලිකාරිය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) සහ කථිකාචාර්ය (ආධුනික) තනතුරු සඳහා සුදුසුකම් සපුරා තිබූ හෙයින් නියමිත කාලපරිච්ඡේදයේදී ඒ සඳහා අයදුම් කළ බවත්ය.




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්.ඒ.ද මෙල් මාවත, කොළඹ-04. இல.14, ஆர்.ஏ.டி.மெல் மாவத்தை, கொழும்பு-04. No.14, R.A. De Mel Mawatha, Colombo-04.

සභාපති / தவிசாளர் / Chaiman: 011-2505551

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74

ඊමේල් / மின்னஞ்சல் / Email: sechrcsl@gmail.com

දුරකථන

ලේකම්

ක්ෂණික

වෙබ්

එම පුරප්පාඩු සඳහා සියලු සුදුසුකම් සපුරා තිබූ නිසාවෙන් අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසන් දිනය වූ 2020.09.21 දිනෙන් පසුව පැමිණිලිකාරිය විසින් සිදු කරන ලද සොයා බැලීමේදී සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගත්තා යැයි සඳහන් වූ කෙටි ලැයිස්තුවේ (short list) පැමිණිලිකාරියගේ නම සඳහන් නොවූ බව දැන ගන්නා ලද බවත්, මේ පිළිබඳව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට ගොස් උපකුලපතිවරයා මුණගැසී පැමිණිලිකාරියට සිදු වී ඇති අසාධාරණය පිළිබඳව විමසූ විට ඔහු තම මේසය මත තිබී මෙම තනතුරට අදාළව සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට නියමිතව තිබූ කෙටි ලැයිස්තුව (short list) පැමිණිලිකාරියට පෙන්වන ලද බවත්, එහි පැමිණිලිකාරියගේ නම සඳහන් නොවන බවත්, ඊට හේතුව ලෙසට එවකට සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ අංශාධිපතිවරයා වශයෙන් සිටි මහචාර්ය මයුර සමරකෝන් මහතා පැමිණිලිකාරියගේ නම ඇතුළත් කිරීමට විරෝධතාවය පළ කිරීම බවත්, මයුර සමරකෝන් මහතාට අවශ්‍ය අය බඳවා ගැනීමට අවස්ථාව ලබාදිය යුතු බවත්, එම ලේඛනයේ සඳහන් වන්නේ ඔහු කැමති අයගේ නම් පමණක් බවත් ප්‍රකාශ කළ බව දක්වා සිටී.

ඒ අනුව පැමිණිලිකාරිය විසින් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට නියමිත කෙටි ලැයිස්තුවේ සියළු සුදුසුකම් සපුරා තිබියදී ඇතුළත් නොවීම සම්බන්ධයෙන් 2021.03.25 දින විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති සහ උප සභාපති වෙත ලිපියක් යොමු කරන ලද බවත්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් පැමිණිලිකාරිය විසින් යොමු කරන ලද ලිපියේම 2021.03.29 වන දින ශ්‍රී ජයවර්ධනපුර උපකුලපතිතුමා වෙත සටහනක් යොදමින් දන්වා ඇත්තේ, 'සුදුසුකම් සපුරා ඇති බවට සාක්ෂි ඉදිරිපත් කර ඇති බැවින් පැමිණිලිකාරියගේ අයදුම්පත්‍රය සම්මුඛ පරීක්ෂණයට කැඳවිය හැකි බවය'. එසේම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපතිවරයා විසින්ද 2021.03.30 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 හි ප්‍රතිපාදන අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස දන්වා ඇත.

කෙසේ වෙතත්, මෙම ලිපි වලට අනුව අදාළ වගඋත්තරකරුවන් පැමිණිලිකාරිය සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට ක්‍රියා නොකළ බවත්, පැමිණිලිකාරිය විසින් නීතිඥයකු මාර්ගයෙන් උපකුලපතිවරයා, පීඨාධිපතිවරයා, හිටපු අංශාධිපති සහ වත්මන් අංශාධිපතිවරුන් හා ලේඛකාධිකාරි වෙත 2021.10.27 දිනැතිව එන්තරවාසි යොමු කරන ලද බවත්, ඉන් පසුව පැමිණිලිකාරියට සම්මුඛ පරීක්ෂණ සඳහා 2021.11.13 දිනැති ලිපියක් මඟින් 2021.11.26 දින සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන ලෙසට දන්වන ලද බවත්, පැමිණිලිකාරිය ඒ අනුව සම්මුඛ පරීක්ෂණයට සහභාගිවූ බවත් දක්වා ඇත.

එම අවස්ථාවේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ පෙනී සිටියේ පැමිණිලිකාරියට අසාධාරණයක් සිදු කරන ලද හා එන්තරවාසිය මඟින් වගඋත්තරකරුවන් ලෙසට නම් කරන ලද 01 වන වගඋත්තරකාර විශ්ව විද්‍යාලයේ ප්‍රධානීන් 05 දෙනා බවත්, ඔවුන් සියලු දෙනාම සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ පැමිණිලිකාරියට ඉතා අපහාසාත්මක ලෙසට හා අපහසුතාවයට පත්වන ආකාරයට ප්‍රශ්න කරමින් පැමිණිලිකාරියගේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කරමින් ඉතා පිළිකුල් සහගත ලෙස කටයුතු කරන ලද බවත්, පැමිණිලිකාරියගේ රැකියාව ලබා නොදෙන බවට එම අවස්ථාවේදි ම ඔවුන් සියලු දෙනාම ප්‍රකාශ

කර සිටි බවත්, එම අවස්ථාවේදී පැමිණිලිකාරිය දැඩි කම්පනයට පත් වූ අතර නීතියේ පිහිට පතා සාධාරණයක් බලාපොරොත්තුවෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මේ සම්බන්ධයෙන් පැමිණිලි කළ බවත් පැමිණිල්ලෙන් වැඩිදුරටත් දක්වා ඇත.

මේ සම්බන්ධව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2022.10.20, 2022.12.08, 2023.01.17, 2023.06.22, 2023.08.22 සහ 2024.01.12 යන දිනයන්හිදී පරීක්ෂණ කටයුතු සිදුකර ඇත.

01 වන වගඋත්තරකාර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කරුණු දැක්වීම :-

01 වන වගඋත්තරකාර විශ්ව විද්‍යාලයේ 2023.07.24 දින ලිපිය මඟින් පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් දන්වා ඇත්තේ, සම්මුඛ පරීක්ෂණ සඳහා පුවත්පත් දැන්වීමක් පළකර අයදුම්පත් කැඳවා අයදුම් කළ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අධ්‍යනාංශ ප්‍රධානි විසින් කෙටි ලැයිස්තු ගත කිරීමකින් පසුව එම අයදුම්කරුවන්ට 2021.11.26 දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වන ලද බවත්,

- ✓ පැමිණිලිකාරිය 2020.08.30 වන දින ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) තනතුර සඳහා අදාළ සම්මුඛ පරීක්ෂණයට සහභාගී වී ඇති අතර, ඇය එහිදී ලකුණු 29 ක් ලබා ගෙන 09 වන ස්ථානයට පත් වූ බවත්,

- ✓ ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරු ලකුණු 81 ලබා ගැනීම හේතුවෙන් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය ) තනතුරට බඳවා ගත් බවත්,

- ✓ කථිකාචාර්ය (ආධුනික) තනතුර සඳහා ද සුදුසුකම් ඇත්ද යන්න සැළකිල්ලට ගත් අවස්ථාවේදී කථිකාචාර්යවරියක වශයෙන් ඉගැන්වීමේ කුසලතාවය පරීක්ෂා කර ඇති බවත්, පැමිණිලිකාරියගේ ඉදිරිපත් කිරීම අනුව තේරීම් කමිටුව සෑහීමකට පත් නොවීම හේතුවෙන් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් සුදුසුකම් සපුරා තිබූ හතරදෙනෙකු බඳවා ගන්නා ලද බවත්ය.

සම්මුඛ පරීක්ෂණය සඳහා තේරීම් කමිටුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ පරිදි උපකුලපති, පීඨාධිපති, අධ්‍යයනාංශ ප්‍රධාන, සනාතන සභාව විසින් නම් කරන ලද සාමාජිකයින් සහ විශ්වවිද්‍යාල පාලක සභා සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත බවත්, සම්මුඛ පරීක්ෂණයේදී පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් කඩනොවන ආකාරයට පැමිණිලිකාරිය සපුරා ඇති සුදුසුකම් වලට අනුකූලවන පරිදි තේරීම් කමිටුව ලකුණු පිරිනමා ඇති බවද දක්වා ඇත.

එසේම 01 වන වගඋත්තරකාර විශ්ව විද්‍යාලය තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ,

✓ පැමිණිලිකාරිය අයදුම් කළ කථිකාචාර්ය තනතුරු [(කථිකාචාර්ය (ආධුනික), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)] සඳහා මේ වන විටත් නිසි කාර්ය පටිපාටිය අනුගමනය කරමින් සුදුසුකම්ලත් කථිකාචාර්යවරුන් බඳවා ගෙන ඇති බවත්,

✓ පැමිණිලිකාරිය විසින් ඇය එම තනතුරු සඳහා බඳවා ගන්නා මෙන් කරන ඉල්ලීම සාධාරණ හා නීත්‍යානුකූල නොවන බවත්,

✓ පැමිණිලිකාරියගේ ඉල්ලීම සලකා බැලීමට නොහැකි හේතුවෙන් මින් මතුවට විශ්වවිද්‍යාලය මඟින් මෙවැනි කථිකාචාර්ය තනතුරු පුරප්පාඩු වී ඇති අවස්ථාවකදී ඇයට අයදුම්පත් යොමු කර තනතුරට සුදුස්සෙකු වේ නම් නිසි කාර්ය පටිපාටිය අනුගමනය කරමින් සම්මුඛ පරීක්ෂණ පවත්වා අදාළ කුසලතා මට්ටම සපුරා ඇති අවස්ථාවකදී අදාළ තනතුර ලබා ගැනීමට බාධාවක් නොවන බවත්ය.

මේ සම්බන්ධයෙන් 2023.08.22 දින පැවැති පරීක්ෂණයේදී කොමිෂන් සභාවේ දැනුම් දීම මත 01 වන වගඋත්තරකාර විශ්ව විද්‍යාලයේ 2023.08.25 සහ 2023.10.18 දිනැති ලිපි මඟින් පැමිණිලිකාරිය සහ කථිකාචාර්ය (ආධුනික) තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගන්නා ලද අයදුම්කරුවන් 04 දෙනා විසින් එකී තනතුර සඳහා අයදුම් කිරීමේදී 01 වන වගඋත්තරකාර විශ්ව විද්‍යාලය වෙත යොමු කරන ලද අයදුම් පත්‍ර සහ සහතිකවල පිටපත් යොමු කර ඇත.

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් අවසන් වරට 2024.01.12 දින පැවැති පරීක්ෂණයේදී 01 වන වගඋත්තරකාර විශ්ව විද්‍යාලය විසින් ඉදිරිපත් කර ඇති කථිකාචාර්ය (ආධුනික) තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදුන් ලේඛනය සහ පැමිණිලිකාරිය ඇතුලු තෝරා ගන්නා ලද අයදුම්කරුවන් හතරදෙනාගේ අයදුම්පත්‍ර සහ සහතික සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ නිරීක්ෂණ ඉදිරිපත් කරන ලද අතර එදින පරීක්ෂණය සඳහා 01 වන වගඋත්තරකාර විශ්ව විද්‍යාලය වෙනුවෙන් පෙනී සිටින ලද නිලධාරිනිය ප්‍රකාශ කර ඇත්තේ, අදාළ නිරීක්ෂණ විශ්ව විද්‍යාල පරිපාලනයට ඉදිරිපත් කර ලිඛිත වාර්තාවක් ලබා දෙන බවයි.

ඒ අනුව 01 වන වගඋත්තරකාර විශ්ව විද්‍යාලයේ 2024.01.22 ලිපිය මඟින්ද දැනුම් දී ඇත්තේ කථිකාචාර්ය (ආධුනික) තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයේදී පහත පරිදි ලකුණු ලබාදී ඇති බවත් එම ලකුණු මත කුසලතා අනුපිළිවෙල අනුව 13 වන ස්ථානය හිමිව ඇති බවත්ය.

| නම | අධ්‍යාපන සුදුසුකම් (Academic Qualifications - Max.40 marks) | සේවා පළපුරුද්ද Work Experience (Max.10 marks) | පර්යේෂණ සහ ප්‍රකාශන Research & Publications (Max.10 marks) | අමතර සුදුසුකම් Additional Qualification (Max.10 marks) | සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතා Performance at the Interview (Max.30 marks) | එකතුව Total | ස්ථානය Rank |
|---|---|---|---|---|---|---|---|
| Mrs. N. W. A. R. W. Nanayakkara | 30 | 04 | 04 | 00 | 03 | 41 | 13 |

එම 2024.01.22 ලිපිය මඟින් වැඩිදුරටත් දන්වා ඇත්තේ, පැමිණිලිකාරියගේ අධ්‍යාපන සුදුසකම් සහ පර්යේෂණ සහ ප්‍රකාශන සඳහා උපරිම ලකුණු ලබාදුන් සේ උපකල්පනය කළහොත් පහත වගුවේ දැක්වෙන පරිදි ලකුණු දැක්විය හැකි බවත් එවිට එම ලකුණු අනුව පැමිණිලිකාරිය හත්වන ස්ථානය හිමිවන බවත්, දැනට පුරප්පාඩුව පැවති කථිකාචාර්ය (ආධුනික) තනතුර සඳහා 04 දෙනෙකු බඳවාගෙන ඇති අතර, එක් තනතුරක පුරප්පාඩුවක් පමණක් ඇති බවත් ය. පැමිණිලිකාරියට ලකුණු අනුව හත්වන ස්ථානය හිමිවන බැවින් හා පැමිණිලිකාරියට ඉහළින් තවත් දෙදෙනෙකු සිටින බැවින් පැමිණිලිකාරිය එම පුරප්පාඩුව සඳහාද බඳවා ගත නොහැකි බවය.

| නම | අධ්‍යාපන සුදුසුකම් (Academic Qualifications - Max.40 marks) | සේවා පළපුරුද්ද Work Experience (Max.10 marks) | පර්යේෂණ සහ ප්‍රකාශන Research & Publications (Max.10 marks) | අමතර සුදුසුකම් Additional Qualification (Max.10 marks) | සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතා Performance at the Interview (Max.30 marks) | එකතුව Total | ස්ථානය Rank |
|---|---|---|---|---|---|---|---|
| Mrs. N. W. A. R. W. Nanayakkara | 40 | 04 | 10 | 00 | 03 | 57 | 07 |

එම ලිපිය මඟින් වැඩිදුරටත් දන්වා ඇත්තේ, Performance at the Interview හි ලකුණු තීරණය කිරීමට විශ්ව විද්‍යාල පරිපාලනයට නොහැකි අතර, ඒ සඳහා උපකුලපතිතුමාගේ ප්‍රධානත්වයෙන් තේරීම්

මණ්ඩලයක් නැවත කැඳවිය යුතු බවත් එසේ කැඳවීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ලිඛිත නිර්දේශයක් අවශ්‍ය බවත්ය.

02 වන වගඋත්තරකාර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කරුණු දැක්වීම :-

02 වන වගඋත්තරකාර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2023.01.17 දින පැවැති පරීක්ෂණයේදී මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් දන්වා ඇත්තේ, 1978 විශ්ව විද්‍යාල පනත ප්‍රකාරව අධ්‍යාන කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අදාළ විශ්ව විද්‍යාලයට බලතල දී ඇති බවත්, ඒ අනුව එම ප්‍රශ්නගත බඳවා ගැනීම සම්බන්ධව කටයුතු කර ඇත්තේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් බවත්ය.

කෙසේවුවද එම පැමිණිලිකාරිය මේ පිළිබඳව විශ්ව විද්‍යාල කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබූ බවත්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපසභාපතිවරයා විසින් 2021.03.30 දිනැති ලිපිය මඟින් එම පැමිණිල්ල සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් ඉල්ලා වගඋත්තරකාර විශ්ව විද්‍යාලයට ලිපියක් ඉදිරිපත් කර ඇති බවත් දක්වා ඇත.

මෙවැනි අගතියට පත් පැමිණිලිකරුවන් වෙනුවෙන් විශ්ව විද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය' විශ්ව විද්‍යාල පනත ප්‍රකාරව පිහිටුවා ඇති බවත් එම මණ්ඩලයේ බලතල ප්‍රකාරව පත්වීම්, උසස් කිරීම් සහ විනය කටයුතු සම්බන්ධ දඬුවම් වලදී අභියාචනා ඉදිරිපත් කිරීමට අදාල 'විශ්ව විද්‍යාල අභියාචනා මණ්ඩලය' වෙත අභියාචනා ඉදිරිපත් කිරීමට හැකි බවට පැමිණිලිකාරියට වැඩිදුරටත් දක්වා සිටින ලද බවත්ය.

නිරීක්ෂණ :-

1. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමට කෙටි ලැයිස්තුව (short list) සකස් කිරීම සඳහා බලය පවතින්නේ කුමන පුද්ගලයෙකුට හෝ කමිටුවකටද යන්න සහ ඒ සඳහා අනුගමනය කරන ලද නිර්ණායක සහ ක්‍රමවේදය කුමක්ද යන්න සහ එකී ක්‍රියාවලිය තුළ පැමිණිලිකාරිය සුදුසුකම් නොලැබුවේද යන්න සහ එලෙස සුදුසුකම් නොලැබුවේ නම් එන්තරවාසි ලද පසු පැමිණිලිකාරිය සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබුවේ කෙසේද යන්න වගඋත්තරකරුවන් විසින් පැහැදිලි කර නැත

2. පැමිණිලිකාරිය විසින් සිය නීතිඥ තිළිණි දෙව්මිණි පයාගල බණ්ඩාර මඟින් 2021.10.27 දිනැතිව යොමු කරන ලද එන්තරවාසියේ නම් කර ඇති සියලු දෙනාම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් වීම තුළින් පැමිණිලිකාරිය කෙරෙහි එකී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සියලු

සාමාජිකයින් සාධාරණ හා අපක්ෂපාති ලෙස කටයුතු කිරීමේ හැකියාව හා ඒ බව දෘෂ්‍යමාන වීම පිළිබඳ ගැටළුවක් නිරීක්ෂණය වේ..

3. තෝරාගෙන ඇති අයදුම්කරුවන් හතරදෙනාගේම අයදුම්පත්‍රයේ Referees ලෙසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින්ව සිටි මහාචාර්ය මයුර සමරකෝන් සහ හෝ මහාචාර්ය ඩබ්. ඒ. එස්. විජේසිංහ යන නම් කර ඇති අතර, තෝරාගෙන ඇති අයදුම්කරුවන් හතරදෙනාම ඔවුන්ගේ පළමු උපාධිය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ලබාගෙන තිබිමද විශේෂත්වයකි.

පැමිණිලිකාරිය එකී මහාචාර්යවරුන් සමඟ සම්බන්ධතාවයක් පවතින බවට බැලූ බැල්මට අනාවරණය නොවන අතර, ඉහත කී සම්බන්ධතාව අනුව තෝරා ගෙන ඇති අයට විශේෂ ලකුණු පිරිනමා ඇති බවට සමස්ථ කරුණු අනුව නිරීක්ෂණය කළ හැකිය
(සැ.යු. – කෙසේවතත් Referees නම් කිරීමේදී එක් අයකු අයදුම්කරු උපාධිය ලැබූ විශ්ව විද්‍යාලයේ හෝ හැදෑරූ විෂයට අදාළ අධ්‍යයනාංශයේ මහාචාර්ය හෝ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයෙකු හෝ අපේක්ෂකයා සේවය කරන ආයතනයේ ප්‍රධානියා විය යුතුයි යන්න දක්වා ඇත )

4. 01 වන වගඋත්තරකාර විශ්ව විද්‍යාලය විසින් 2023.08.25 දිනැති ලිපිය මඟින් අයදුම්පත්‍ර සමඟ පැමිණිලිකාරිය ඉදිරිපත් කර ඇති අධ්‍යාපන සහතික පිටපත්ද, 2023.10.18 ලිපිය මඟින් තෝරාගන්නා ලද අයගේ අධ්‍යාපන සහතිකවල පිටපත්ද කොමිෂන් සභාව වෙත යොමු කර තිබූ බැවින් එකී සහතික සහ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලේඛණය අනුව පැමිණිලිකාරිය සඳහා පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද බවට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි පීඨය මඟින් නිකුත් කරන ලද ලිපිය මත පිහිටා පශ්චාත් උපාධිය සඳහා නියමිත ලකුණු 10 පිරිනමා නොමැති බව නිරීක්ෂණය වී ඇත.

එහෙත් පළමු ස්ථානයට තෝරාගෙන ඇති ඩබ්. එම්. ශ්‍යාමලි නැමැති අයදුම්කාරිය විසින් ඉදිරිපත් කර ඇත්තේද ඇයගේ පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද බවට වූ ලිපියක් බවද එම ලිපිය මත පිහිටා නියමිත ලකුණු ලබාදී ඇති බවද නිරීක්ෂණය වේ.

5. පැමිණිලිකාරිය Temporary Lecturer සහ Visiting Lecturer වරියක ලෙස වසර 03ක පළපුරුද්දක් සඳහා ලකුණු 04 ක් පිරිනමා ඇති අතර, දෙවන ස්ථානයට තේරී ඇති අයදුම්කාරිනියට දහම් පාසල් ගුරුවරියක ලෙස කටයුතු කිරීම සලකා බලා ලකුණු 04ක් පිරිනමා තිබීමද, Temporary Assistant Lecturer ලෙස වසර 3 මාස 7 ක් ඇති පළමු ස්ථානයට තෝරාගෙන ඇති ඩබ්. එම්. ශ්‍යාමලි නැමැති අයදුම්කාරියට අවුරුදු 4ක් සඳහා වූ සම්පූර්ණ ලකුණු ප්‍රමාණය වන ලකුණු 08 ක් පිරිනමා ඇති බවද නිරීක්ෂණය වේ.

6. ලකුණු ලැයිස්තුව අනුව පර්යේෂණ හා ප්‍රකාශන නිර්ණායක සඳහා තෝරා ගෙන ඇති අයදුම්කරුවන්ට වැඩි ලකුණු පිරිනමා ඇති බවද නිරීක්ෂණය වන අතර, පළමු ස්ථානයට තෝරාගෙන ඇති ඩබ්. එම්. ශ්‍යාමලි නැමැති අයදුම්කාරියගේ, බොහෝ පර්යේෂණ සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සිටි තැනැත්තෙකු සාමාජිකයෙකු ලෙස සම්බන්ධව කටයුතු කර ඇති බවද නිරීක්ෂණය වේ.

7. Additional Qualification සඳහා ලකුණු ලබාදීමේ ලේඛනයේ සඳහන් කර ඇත්තේ Medal in Convocation සහ Membership in Professional Institute සඳහා ලකුණු ලබාදීමක් පමණක් වේ.

කෙසේවෙතත් 01 වන වගඋත්තරකාර විශ්ව විද්‍යාලය විසින් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද තෝරාගන්නා ලද අයගේ අයදුම්පත්‍ර පරීක්ෂා කිරීමේදී එවැනි සුදුසුකමක් දක්නට නොලැබෙන පළමු ස්ථානය සහ දෙවන ස්ථානය ලබාගත් අයට ලකුණු 2 බැගින් ලබා දී ඇති බවත්, මෙම කොටස සඳහා පැමිණිලිකාරියට ලකුණු ලබාදීමක් සිදු කර නොමැති බවත් නිරීක්ෂණය වේ.

8. සම්මුඛ පර්යේෂණයේදී දැක්වූ කුසලතාවය සඳහා (Performance at the Interview) ලකුණු 30ක් වැනි සැළකිය යුතු විශාල ලකුණු සංඛ්‍යාවක් වෙන් කර තිබීමද කොමිෂන් සභාවේ අවධානයට ලක්විය.

9. එසේම සම්මුඛ පරීක්ෂණයේදී දැක්වූ කුසලතාවය සඳහා ලකුණු ලබාදීමේදී තෝරා ගෙන ඇති අයදුම්කරුවන් සියළුදෙනාට ලකුණු 20 න් ඉහල ලකුණු සංඛාවක් පිරිනමා ඇති අතර, අනෙකුත් සියළු දෙනාට ලකුණු 10 හෝ ඊට ඉහල ලකුණු පිරිනමා ඇත. පැමිණිලිකාරියට පමණක් ලකුණු 03 ක් වැනි ඉතා අඩු ලකුණු සංඛ්‍යාවක් පිරිනැමීම තුළින් ඇයට තරඟකාරී සම්පූර්ණ ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට තිබුණු අවස්ථාව මඟහැරී ගොස් ඇති බව විශේෂයෙන් නිරීක්ෂණය කළ හැක. මෙහිදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් තමන්ට රිසි නොවන අයදුම්කරුවෙකු උදෙසා ලකුණු අඩු කිරීමට අවශ්‍ය අවස්ථාවන් වලදී අභිමතය සහිත ලකුණු ලබාදෙන මෙම කොටස තුළින් උවමනාවෙන් ලකුණු ලබා නොදීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

10. අයදුම්කරුවන් දෙදෙනෙකුගේ සම්මුඛ පර්යේෂණ කුසලතා වෙනුවෙන් ලබාදී ඇති ලකුණු එක් අයෙකුගේ අත්සනින් පමණක් වෙනස් කර ඇති අතර, එම වෙනස් කිරීම හේතුවෙන් දෙවන ස්ථානයට තේරී පත්වූ අයට ලකුණු ප්‍රමාණය 17 සිට 23 ලෙස දක්වා ලකුණු 5 ක් වැඩි කර ඇති බවත් ලේඛණ අනුව නිරීක්ෂණය වේ.

නිගමනය :-

ප්‍රශ්නගත සම්මුඛ පරීක්ෂණය සාධාරණ සහ අපක්ෂපාතීව පැවැතුනේ නම් පැමිණිලිකාරියට කථිකාචාර්ය (ආධුනික) තනතුර සඳහා වූ සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේ නිර්ණායක අනුව පහත පරිදි ලකුණු ලබා ගැනීමේ හැකියාවක් පැවති බව නිරීක්ෂණය කළ හැක.

I. අධ්‍යාපන සුදුසුකම් (Academic Qualifications - Max.40 marks)
- ✓ පළමු පන්තියේ සමාජ විද්‍යා ශාස්ත්‍රවේදී උපාධි - ලකුණු 30
- ✓ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධිය - ලකුණු 10

ඒ අනුව අධ්‍යාපාන සුදුසුකම් මත පැමිණිලිකාරියට ලකුණු 40 ක්ද ලැබිය යුතු වුවද ඒ සඳහා ලකුණු 30 ක් පමණක් ලබා දී ඇත.

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් අවසන් වරට 2024.01.12 දින පැවැති පරීක්ෂණයේදී පළමු ස්ථානයට තෝරාගෙන ඇති ඩබ්.එම්. ශ්‍යාමලි නැමැති අයදුම්කාරිය විසින් ඉදිරිපත් කර ඇත්තේ, ඇයගේ පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද බවට වූ ලිපියක් වන අතර, එම ලිපියට නියමිත ලකුණු ලබාදී ඇති බැවින් පැමිණිලිකාරියට පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද බවට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි පීඨය මඟින් නිකුත් කරන ලද ලිපියට පශ්චාත් උපාධිය සඳහා නියමිත ලකුණු 10 ලබා නොදීමට හේතු විමසීමේදී, ඒ සඳහා කරුණු ඉදිරිපත් කරමින් 01 වන වගඋත්තරකාර විශ්ව විද්‍යාලයේ 2024.01.22 ලිපිය මඟින් අධ්‍යාපන සුදුසුකම් (Academic Qualifications) සඳහා උපරිම ලකුණු ලබාදුන් සේ උපකල්පනය කර පැමිණිලිකාරියට ලකුණු 40 ක් ලබා දී ඇත.

කෙසේ වෙතත් පළමු ස්ථානයට තෝරාගෙන ඇති ඩබ්. එම්. ශ්‍යාමලි නැමැති අයදුම්කාරියට පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද බවට වූ ලිපිය සඳහා ලකුණු ලබා දීමක් සිදු කර ඇති බැවින් පැමිණිලිකාරියටද පශ්චාත් උපාධිය සඳහා වූ **ලකුණු 10 හිමි විය යුතු ලකුණක්** ලෙස කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

II. Work Experience (Max.10 marks)

දෙවන ස්ථානයට තේරී ඇති අයදුම්කාරියට දහම් පාසල් ගුරුවරියක ලෙස කටයුතු කිරීම සලකා බලා ලකුණු 04ක් පිරිනමා ඇති අතර, එම ලකුණු ඇයට හිමි නොවිය යුතු ලකුණක් ලෙස කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

III. Research & Publications (Max.10 marks)

පැමිණිලිකාරිය පරියේෂණ ප්‍රකාශන 06 සහ පොත් 04 ක් සහ පුවත්පත් ලිපි පළකර ඇත. ඒ සඳහා ලකුණු 04 ක් ලබා දී ඇත.

පැමිණිලිකාරියට මෙ යටතේ ලකුණු ලබාදීම සම්බන්ධයෙන් අවසන් වරට 2024.01.12 දින පැවැති පරීක්ෂණයේදී 01 වන වගඋත්තරකාර විශ්ව විද්‍යාලයෙන් හේතු විමසන ලද අතර, ඒ සඳහා ප්‍රතිපිළිතුරු ලෙස 01 වන වගඋත්තරකාර විශ්ව විද්‍යාලයේ 2024.01.22 ලිපිය මගින් පර්යේෂණ සහ ප්‍රකාශන සඳහා උපරිම ලකුණු ලබාදුන් සේ උපකල්පනය කර ලකුණු 10 ක් ලබා දී ඇත. එම ලිපිය මගින් ලබා දී ඇති ලකුණු සම්බන්ධයෙන් කිසිදු හේතු දැක්වීමක් සිදු කර නොමැත.

IV. Additional Qualification (Max.10 marks)

Medal in Convocation සහ Membership in Professional Institute ආදිය සලකා බලන බව ලකුණු ලබාදීමේ ලේඛනයේ දක්වා ඇති අතර, අතිරේක සුදුසුකම් සඳහා පැමිණිලිකාරියට ලකුණු ලබාදීමක් සිදු කර නොමැත.

කෙසේවෙතත් 01 වන වගඋත්තරකාර විශ්ව විද්‍යාලය විසින් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද තෝරාගන්නා ලද අයගේ අයදුම්පත්‍ර පරීක්ෂා කිරීමේදී එවැනි සුදුසුකමක් දක්නට නොලැබෙන පළමු සහ දෙවන ස්ථාන ලබාගත් අයදුම්කරුවන්ට ලකුණු 02 බැගින් පිරිනැමීමේ නිර්ණායක මොනවාද යන්න පැහැදිලි නොවන අතර, ලකුණු ලබාදීමේ පටිපාටියෙන් බැහැරව ලබා දී ඇති ලකුණු ඔවුනට හිමි නොවිය යුතු ලකුණක් ලෙස කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

V. Performance at the Interview (Max.30 marks)

තෝරාගත් 4 දෙනාට පිළිවෙලින් ලකුණු 20, 23, 24 සහ 24 ලෙසින් ලකුණු ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයේදී දැක්වූ දක්ෂතා යටතේ පිරිනමා ඇති අතර, සමස්ථ සම්මුඛ පරීක්ෂණයේදී මෙ යටතේ අවම ලකුණු 10 සිට උපරිම ලකුණු 24 දක්වා වූ ලකුණු පරාසයක් තුල පැමිණිලිකාරිය හැර අනෙක් සියලු අයදුම්කරුවන් වෙත ලකුණු පිරිනමා ඇත.

පැමිණිලිකාරියට සම්මුඛ පරීක්ෂණයේදී දැක්වූ දක්ෂතා සඳහා ලකුණු 30 න් ලකුණු 03 ක් ලබා දීම තුළින් සම්මුඛ පරීක්ෂණයේදී තරඟකාරී මට්ටමට පැමිණීමට තිබූ ඉඩ ප්‍රශ්ථාව අහිමිවී ගොස් ඇති බව නිරීක්ෂණය කරයි.

එක් අයෙකුගේ අත්සනින් දෙවන ස්ථානයට තේරී පත්වූ අයට ලකුණු ප්‍රමාණය 17 සිට 23 ලෙස දක්වා ලකුණු 5 ක් වැඩි කර ඇති බැවින් එම තැනැත්තියට එකී තනතුරු ලබාදීමේ අරමුණින්ම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සිට සාමාජිකයකු එම ලකුණු වැඩි කර ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණ කරයි.

01 වන වගඋත්තරකාර විශ්ව විද්‍යාලයේ 2024.01.22 දිනැති ලිපිය මඟින් Performance at the Interview හි ලකුණු තීරණය කිරීමට විශ්ව විද්‍යාල පරිපාලනයට නොහැකි බවත් ඒ සඳහා උපකුලපතිතුමාගේ ප්‍රධානත්වයෙන් තේරීම් මණ්ඩලයක් නැවත කැඳවිය යුතු බවත් එසේ කැඳවීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ලිඛිත නිර්දේශයක් අවශ්‍ය බවත් දන්වා ඇත.

කරුණු එසේ හෙයින් ලකුණු 03 ක් වැනි ඉතා අඩු ලකුණු ප්‍රමාණයක් ලබා දීම තුළින්ම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පැමිණිලිකාරිය වෙනස්කොට සැලකීමක් සිදු කර ඇති බවත් සමස්ථ සම්මුඛ පරීක්ෂණයේදී පැමිණිලිකාරිය හැර අනෙකුත් අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණයේදී දැක්වූ දක්ෂතා යටතේ ලබාදී ඇති අවම ලකුණ වන ලකුණු 10 ක ලකුණු ප්‍රමාණය පැමිණිලිකාරිය වෙත හිමිවිය යුතු බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

ඒ අනුව සියලු කරුණු සලකා බැලීමෙන් අනතුරුව ප්‍රශ්නගත සම්මුඛ පරීක්ෂණය සාධාරණ සහ අපක්ෂපාතිව පැවතුනේ නම් පැමිණිලිකාරියට හිමිවිය යුතුව තිබූ ලකුණු 17 ක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අත්තෝනෝමතිකව අහිමි කර ඇති බවත් බැලූ බැල්මට පෙනේ.

ඉහත කරුණු අනුව කථිකාචාර්ය (ආධුනික) තනතුර සඳහා වූ සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදී ඇති ආකාරය ප්‍රශ්න සහගත බවත් ඒ තුළින් පැමිණිලිකාරියට වෙනස්කොට සැළකීමක් සිදුව ඇති බවත් නිරීක්ෂණය වී ඇත.

මෙකී සමස්ථ නිගමන අනුව 01 වන වගඋත්තරකාර විශ්ව විද්‍යාලය තම විධායක සහ පරිපාලන ක්‍රියාවන් තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මින් නිගමනය කරමු.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.**

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය (ආධුනික) තනතුරට බඳවා ගැනීම සඳහා 2021.11.26 දින පැවැති සම්මුඛ පරීක්ෂණයේදී පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කර ඇති සියලු ලේඛන සහ සම්මුඛ පරීක්ෂණය මඟින් තේරීපත් වූ අනෙකුත් අපේක්ෂකයන් හතර දෙනාගේ අයදුම්පත් ස්වාධීන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් වෙත යොමු කර නැවත ඇගයීමට ලක් කළයුතු බවත්, එසේ කිරීමෙන් අනතුරුව පැමිණිලිකාරිය එකී තනතුරට අදාළ සුදුසුකම් සපුරන්නේ නම් දැනට පවතින පුරප්පාඩුව සඳහා පැමිණිලිකාරිය බඳවා ගැනීමටත් කටයුතු කළ යුතුය.

2024. 05. 22 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව පොලිස්පති වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව,

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :- අමාත්‍යතුමා,
උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
වෝඩ් පෙදෙස, කොළඹ 07

B/